<u>කරන්දෙණිය ප්‍රාදේශීය සභාව</u>
<u>ගාල්ල දිස්ත්‍රික්කය</u>

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------
මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**
**-------------------------------------------------------------**

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**
සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) රු.1,726,355 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා පරිත්‍යාග, ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගෙන තිබූ රු.58,120 ක් වූ වට්ටෝරු බඩු ප්‍රාග්ධනිත කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලී බඩු හා සවිකිරීම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය රු.58,120 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.1,351,211 ක් වුවද, එය රු.1,400,875 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.49,664 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.3,758,861 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) බැංකුවෙන් ලබාගෙන තිබූ රු.8,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතුව තිබූ රු.4,899,106 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(උ) සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 07 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර මෙකී ඉඩම් සඳහා හිමිකම් ඔප්පුවක් හෝ පැවරුම් නියෝගයක් සභාව සතුව නොතිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.738,195 ක වෙනසක් පැවතුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.132,800,029 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන හා යාවත්කාලීන කරන ලද විදුලි බඩු ලේඛනය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,377,946 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,079,312 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු, අක්කර බදු හා පොල බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගත යුතුව තිබූ රු.1,858,897 ක් වූ වරිපනම් බදු, රු.63,969 ක් වූ අක්කර බදු හා රු.797,145 ක් වූ පොල බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගත යුතුව තිබූ රු.123,350 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 1,612,292 ක උසාවි දඩ හා රු. 11,218,720 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.4** මහ ඒදණ්ඩ වෙළඳ සංකීර්ණයේ **කඩ කාමර බදුදීම**

---------------------------------------------------------

මහ ඒදණ්ඩ වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ කඩ කාමර 12 ක් සහ පහල මහලේ කඩ කාමර 12 ක් පිළිබඳව 2014 ජනවාරි 23 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බදු ගිවිසුමේ 01 වන කොන්දේසිය ප්‍රකාරව සෑම මසකම බදු මුදල් 15 වැනි දින හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවද 2013 සැප්තැම්බර් 30 දිනට කඩ කාමර සඳහා රු.67,152 ක හිඟ බදුකුලී පැවතුණි. මෙම කොන්දේසිය යටතේ ගෙවීම් ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම මාසික කුලියෙන් 1% ක අධි ගාස්තුවක් ගෙවිය යුතු වුවද සභාව විසින් එම අධි ගාස්තුව ලේඛනවල සටහන් කිරීමක් හෝ අය කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) ගිවිසුමේ 04 වන කොන්දේසිය අනුව බදු ගත් දේපල අතුරු බදු නොදිය යුතු වුවද කඩ කාමර 07 ක් අතුරු බදු දී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) ගිවිසුමේ 08 වන කොන්දේසිය ප්‍රකාර බදුකරු විසින් බදුගෙන ඇති කඩ කාමරය හැර ඉන් පිටත වෙළඳ ද්‍රව්‍ය නොතිබිය යුතු වුවද පහල මහලේ අංක 1කඩ කාමරයේ බදුකරු විසින් පඩිපෙළ යට නිරාවරණව පවතින කොටස යකඩ ගේට්ටුවකින් ආවරණය කර, එය තුළ සහ වෙළඳ සංකීර්ණය සඳහා ඉදිකල වැසිකිලිය තුළ වෙළඳ ද්‍රව්‍ය තොග ගබඩා කර තිබුණි.

**2.2.5** **සතිපොල බදු**

----------------

ඌරගස්මංහන්දිය සතිපොල ආදායම් එකතු කිරීම පිළිබඳව 2013 දෙසැම්බර් 13 දින සිදු කරන ලද ස්ථානීය විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පොල බදු කුවිතාන්සි පොත් වල ප්‍රධාන කාර්යාලයේ හෝ උප කාර්යාලයේ මුද්‍රාව තබා නොතිබුණි.

(ii) සතිපොලේ අංක කරන ලද කඩ කුටි 322 ක් තිබුණ ද, එයින් වෙළඳාම් කරනු ලබන කඩ කුටි ප්‍රමාණය 150 ක් බව නිරීක්ෂණය විය.

(iii) කඩ කුටි වෙළඳාම් කිරීමට යොදා නොගෙන ඉන් ඉදිරිපිට කූඩාරම් ගසා වෙළඳාම් කිරීම් සිදුකර තිබුණ අතර, කඩ කුටි, තොග රැස් කිරීමට හා යතුරුපැදි ගාල්කර තැබීම වැනි අනෙකුත් අවශ්‍යතා සඳහා යොදාගෙන තිබුණි.

(iv) දකුණු පළාත් ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් සති පොලෙහි ඉදිකරන ලද කඩ කාමර 26 ක වෙළඳාම් කටයුතු සිදුකර තිබුණ ද ඒවායින් බදු මුදල් එකතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**එකතු කරන ලද බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම**

2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 66/67 වගන්තිය අනුව, සභාව විසින් 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අයකර ගෙන තිබූ රු.12,066,058 ක එකතු කළ අගය මත බදු හා 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත අනුව අය කරගෙන තිබූ රු.394,855 ක මුද්දර බදු හා නිශ්චිත ගාස්තු රු.16,940 ක් ද වශයෙන් එකතුව රු.12,477,253 ක් වූ බදු මුදල් 2014 නොවැම්බර් මාසය දක්වාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

### 3.2 අවිධිමත් ගනුදෙනු

(අ) 2013 අගෝස්තු මාසයේ විනෝද චාරිකාවක් සඳහා කරන්දෙණිය ප්‍රාදේශීය සභා සේවක සුභසාධක සංගමය වෙත සභා අරමුදලින් රු.200,000 ක් ගෙවා තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් නීතිමය ප්‍රතිපාදන සලසා නොමැති කාරණයක් සඳහා මෙම ගෙවීම සිදුකර තිබූ බව විගණනයේදි නිරික්ෂණය විය.

(ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක: දපපා/ආ/05/6/පොදු හා 2009 අප්‍රේල් 23 දිනැති ලිපිය අනුව සභාපතිවරුන්ට ඔවුන්ගේ පෞද්ගලික ජංගම දුරකථන බිල්පත්වලින් මාසිකව රු.2,000 ක මුදලක් සභා අරමුදලින් වැය කිරීමට පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර තිබුණද එකී නියමයට පටහැනිව 2011 අප්‍රේල් 07 දින පැවති මාසික සභා රැස්වීම් තීරණය පරිදි මාසයකට රු.4,000 බැගින් 2012 ජනවාරි මස සිට 2012 සැප්තැම්බර් මාසය දක්වා ජංගම දුරකථන දීමනා ලෙස රු.36,000 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 පිළිතුරු නොදුන් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 19 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.31,859,181 ක් විය.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය